චක්‍රලේඛ අංක. දු.සා./ප්‍ර.දු.ග.(ආII)01/2016


දුම්රිය
புகையிரத
Railway
GMF 35

ඔබේ අංකය
உமது இல
Your No.

දුරකථනය (දු.සා)
தொலைபேசி (இ.பு.பொ.மு.)
Telephone (G.M.R.)
2431177

e – mail:- gmrslr@sltnet.lk

කාර්යාලය
அலுவலகம்
Office
2421281

ෆැක්ස්
தொலைமகல்
Fax
2446490


# ශ්‍රී ලංකා දුම්රිය සේවය
## இலங்கை புகையிரத சேவை
## SRI LANKA RAILWAYS


මගේ අංකය.
எனது இல.
My No.
ඵ.ප./ඵ.ක.වි.කි./2015

සාමාන්‍යාධිකාරී කාර්යාලය,
තැ.පෙ.355, ඕල්කොට් මාවත,
කොළඹ - 10

பொது முகாமையாளர் அலுவலகம்.
த.பெ. 355, ஓல்கொட் மாவத்தை.,
கொழும்பு - 10

General Manager's Office,
P.O.Box 355, Olcott Mawatha,
Colombo – 10


දිනය
திகதி
Date
2016.12.31

ජනාධිපති ලේකම්

අග්‍රාමාත්‍ය ලේකම්

අමාත්‍ය මණ්ඩල ලේකම්

සියලුම කොමිෂන් සභාවල ලේකම්වරුන්

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

සියලුම ප්‍රධාන ලේකම්වරුන්

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

### දුම්රිය බලපත්‍ර වෙනුවෙන් ගෙවීම් කිරීම

දුම්රිය බලපත්‍ර සඳහා දැනට ක්‍රියාත්මක චෙක්පත් මගින් ගෙවීම් කිරීමේ ක්‍රියාමාර්ගය යටතේ නියමිත පරිදි අදාළ චෙක්පත් නොලැබීම හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ බලපත්‍ර ආදායම් ශීර්ෂය යටතේ දීර්ඝකාලීනව නිරවුල් නොවූ හිඟ ආදායම් වාර්තාවී ඇති අතර එම හිඟ ආදායම් සම්බන්ධයෙන් විගණකාධිපති විසින් ද ඔහුගේ නිරීක්ෂණ දක්වා ඇත.

එබැවින් දුම්රිය බලපත්‍ර නිරවුල් කිරීමේදී ඇති විය හැකි හිඟ ගෙවීම් අවම කිරීම අරමුණු කරගෙන 2017 ජනවාරි මස සිට පහත දැක්වෙන නව වැඩපිළිවෙල හඳුන්වාදෙනු ලැබේ.

### 01. බලපත්‍ර නිකුත් කිරීම

මීට පෙර මවිසින් වරින් වර ලබා දී ඇති උපදෙස් වෙනුවට පහත පරිදි කටයුතු කරන ලෙස මෙයින් දන්වමි.

I. දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඔබ දෙපාර්තමේන්තුව/ ආයතනය / අමාත්‍යාංශය හඳුනාගැනීමට ලබා දී ඇති අංකය අනිවාර්යයෙන්ම ඇතුලත් කළ යුතුය. මීට අමතරව ඔබ දෙපාර්තමේන්තුව / ආයතනය යටතේ වෙනත් දෙපාර්තමේන්තු / ආයතන සඳහා සේවකයින් අනුයුක්ත කර සිටී නම් ඔවුන් වෙනුවෙන් නිකුත් කරනු ලබන දුම්රිය බලපත්‍රවලට එම දෙපාර්තමේන්තුව සඳහා ලබාදී ඇති සංකේත අංකය යොදන ලෙස උපදෙස් ලබාදිය යුතු ය.

II. නිවාඩු දුම්රිය බලපත්‍ර නිකුත් කිරීමේදී දුම්රිය ඒබී 70 පෝරමය සහ රාජකාරි බලපත්‍ර සම්බන්ධයෙන් වන ඒබී 70 බී ආකෘති පත්‍රයේ බලපත්‍ර නිකුත් කරනු ලබන අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුවේ වියදම් ශීර්ෂය / වැඩසටහන / ව්‍යාපෘතිය පැහැදිලිව සඳහන් කළ යුතු අතර වැය විෂය ලෙස වෙනත් දීමනා වැය විෂය වන 1003 සඳහන් කළ යුතු ය.

III. දුම්රිය බලපත්‍ර නිකුත් කිරීමේදී ආයතන සංග්‍රහයේ XIII පරිච්ඡේදයේ 1.5 හා 1.6 හා ඡේදයන්හි උපදෙස්වලට අනුකූලව බලපත්‍රය සම්පූර්ණ කර තිබිය යුතු ය.

IV. දුම්රිය බලපත්‍ර නිකුත් කිරීමේදී බලය ඇති දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඒ සඳහා බලය පවරන ලද නිලධාරියකු විසින් දුම්රිය බලපත්‍ර අත්සන් කිරීමේදී නම හා තනතුරේ නිල නාමය සහිත රබර් මුද්‍රාවක් තබා අත්සන් කළ යුතු ය. දුම්රිය බලපත්‍රය ලිවීමේදී ඇති වන වෙනස්වීම්වලදී ද මෙලෙස අත්සන් කර නිල නාමය සහිත මුද්‍රාව තැබිය යුතු ය.

02. <u>දුම්රිය බලපත්‍ර බිල්පත් ගාස්තු නිරවුල් කිරීම</u>

I. 2016.12.31 දිනට පෙර නිකුත් කළ හා හිඟ හිටි බලපත්‍ර බිල්පත් සඳහා දුම්රිය සාමාන්‍යාධිකාරි නමින් ලියන ලද චෙක්පතකින් ගෙවීම් කළ යුතු අතර, එම චෙක්පතෙහි වටිනාකම සනාථ කිරීම සඳහා එම බිල්පත්වල පිටපත් හා ගෙවීම් විස්තර චෙක්පතට අමුණා එවීමට කටයුතු කරන්න.

II. 2017 ජනවාරි 01 ට පසුව නිකුත් කරනු ලබන නිවාඩු හා රාජකාරි දුම්රිය බලපත්‍රවල වටිනාකම පිළිවෙලින් ඒබී 70 හා ඒබී 70 බී පෝරමයේ ඇතුලත් ඔබගේ වැය ශීර්ෂයන්ට මා විසින් හර කර මාසික ගිණුම් සාරාංශ මගින් භාණ්ඩාගාරයට වාර්තා කරනු ලබන අතර ඊට අදාළ හර නිවේදන හා දුම්රිය බලපත්‍ර හා බිල්පත පිටපත් 2 කින් අදාළ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වෙත මාසිකව ඉදිරිපත් කරනු ලැබේ. එහිදී බිල්පත්වල කිසිදු වෙනසක් අනාවරණය වූ විටක එම වෙනස නිවැරදි කිරීම සඳහා ඊළඟ මස 25 දිනට ප්‍රථම ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත එවීමට කටයුතු කරන්න. ඒ සඳහා ෆැක්ස් අංක. 0112-432752 ට හා ලිඛිතව තොරතුරු ඉදිරිපත් කිරීම අනිවාර්යවේ. එබැවින් 2017 ජනවාරි 01 දිනට පසුව නිකුත් කරනු ලබන බලපත්‍ර වෙනුවෙන් චෙක්පත් නිකුත් කිරීම සිදුනොකළ යුතු ය.

03. <u>විශ්‍රාමිකයන්ට දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම හා ගාස්තු අය කිරීම</u>

I. විශ්‍රාමිකයන් හා ඔවුන්ගෙන් යැපෙන්නන් සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, මොබිටෙල් ආයතනය හා දුම්රිය දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ආරම්භ කර ඇති ආසන වෙන්කිරීමේ

ක්‍රමයට අනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හඳුන්වා දී ඇති වැඩපිළිවෙල අනුව විශ්‍රාමික හැඳුනුම්පත් අංක හා ජාතික හැඳුනුම්පත් අංක දුම්රිය ස්ථානාධිපති වෙත ඉදිරිපත් කිරීමෙන් හෝ විශ්‍රාමිකයා විසින් ජංගම දුරකථන මගින් ආසන වෙන්කිරීමේ වැඩපිළිවෙල අනුව දුරකථන ජාලයන් අමතා විශ්‍රාමික හැඳුනුම්පත් අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය දුරකථනයෙන් ඉදිරිපත් කර ආසන වෙන්කර ගැනීම සිදුකළ යුතු ය. ඒ අනුව මාසිකව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් දුම්රිය දෙපාර්තමේන්තුවට පියවිය යුතු මුදල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ගේ වැය විෂයට හර කර දුම්රිය දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂයට බැර කර මාසික සාරාංශ තුළින් වාර්තා කළ යුතු ය.

II. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිගණක පද්ධතිය මගින් නිකුත් කරනු ලබන මුද්‍රිතය අනුව දුම්රිය ස්ථාන මගින් සාමාන්‍ය ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. ඉන්පසු දුම්රිය දෙපාර්තමේන්තුව විසින් පසුව එයට අදාළ බිල්පත් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත යොමු කරන අතර එම බිල්පත් වටිනාකම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් හරස් සටහන් මගින් දුම්රිය දෙපාර්තමේන්තුවට පියවනු ලබයි. එබැවින් මින් ඉදිරියට ප්‍රාදේශීය ලේකම් වෙත විශ්‍රාමිකයින් වෙනුවෙන් දුම්රිය බිල්පත් එවීමක් සිදුකරනු නොලැබේ.

04. පළාත් සභා විසින් නිකුත් කරනු ලබන නිවාඩු හා රාජකාරි දුම්රිය බලපත්‍ර පියවීම ඉහතින් දක්වන ලද හරස් සටහන් ක්‍රමවේදය යටතේ සිදුකළ නොහැකි බැවින් පළාත් සභා විසින් එම පළාත් සභා යටතේ ඇති අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු සේවකයින්ට නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා කඩිනමින් චෙක්පත් මගින් පියවීමට පියවර ගත යුතු අතර එසේ නොවුහොත් හිඟ ගෙවීම් සහිත පළාත් සභා වෙත නව දුම්රිය බලපත්‍ර නිකුත් කිරීමේදී යම් සීමාවන් පැනවීමට සිදුවනු ඇත.

05. <u>පොදු කරුණු</u>

I. ඉහතින් විස්තර කළ කරුණුවලට අමතරව බලපත්‍ර නිකුත් කිරීමට පෙර තම දෙපාර්තමේන්තුව සඳහා ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන තිබෙන බව තහවුරු කර ගැනීමටත්,

II. වෙනත් කාර්යාලවලින් අනුයුක්ත කළ නිලධාරින් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ සිට දුම්රිය දෙපාර්තමේන්තුවට බිල්පත් පියවීම අවසන් වන තෙක් අදාළ උප කාර්යාල හා වෙනත් කාර්යාල සමඟ අභ්‍යන්තර ක්‍රමවේදයක් සකස් කර ගැනීමටත්,

III. බිල්පත් නිරවුල් කිරීම 2017 ජනවාරි 01 න් පසුව නිකුත් කරන බලපත්‍ර සඳහා හරස් සටහන් මගින් ගිණුම්ගත කරන බැවින් ගිණුම්ගත කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත්ව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාම ඔබගේ ගණකාධිකාරීවරුන් සමඟ සම්බන්ධීකරණය කර සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමටත්,

IV. පළාත් සභාවලින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත බිල්පත් ගාස්තු පියවීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන ඒ ඒ පළාත් සභාවල අදාළ වැය ශීර්ෂ යටතේ ප්‍රතිපාදන වෙන් කිරීමටත්, ඒ සඳහා ප්‍රධාන ලේකම්වරුන් විසින් සියළු කටයුතු සම්බන්ධීකරණය කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

06. මේ සම්බන්ධව පැහැදිලි කිරීම අවශ්‍ය නම් ප්‍රධාන මූල්‍ය නිලධාරි දුරකථන අංක. 011-2432325 හෝ දුම්රිය ගණකාධිකාරි (ආදායම් II) දුරකථන අංක. 011-2432752 හෝ බලපත්‍ර බිල්පත් අංශය දුරකථන අංක. 011-2421281 දිගුව 331 මගින් ලබාගත හැකිය.

07. මෙම චක්‍රලේඛය භාණ්ඩාගාරයේ එකඟත්වය මත නිකුත් කරන අතර, මෙම විධිවිධාන 2017.01.01 දින සිට බල පැවැත්වේ.

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී

පිටපත්:

01. ලේකම්, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය - දැ. පි.

02. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - අදාළ දෙපාර්තමේන්තුවලට ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබාදීම සඳහා

03. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - සිගාස් පරිගණක වැඩසටහනට යම් සංශෝධනයක් කළ යුතු නම් සහාය දක්වීම සඳහා

04. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව - ප්‍රමාණවත් අක්මුදල් දුම්රිය දෙපාර්මේන්තුවට මුදාහැරීම සඳහා

05. විගණකාධිපති - දැ. පි.

06. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දුම්රිය දෙපාර්තමේන්තුව - දැ. පි.